විශේෂ සටහන 15

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග : 2015[1]

### මූර්ත අංශය[2]

2015 ජනවාරි 22 - ප්‍රධාන ඛනිජ තෙල් නිෂ්පාදනයන්හි සිල්ලර මිල ගණන් පහත පරිදි අඩු කරන ලදී.

- පෙට්‍රල් (ඔක්ටේන් 92) ලීටරයක මිල රුපියල් 117 දක්වා රුපියල් 33 කින්
- පෙට්‍රල් (ඔක්ටේන් 95) ලීටරයක මිල රුපියල් 128 දක්වා රුපියල් 30 කින්
- ඔටෝ ඩීසල් ලීටරයක මිල රුපියල් 95 දක්වා රුපියල් 16 කින්
- සුපර් ඩීසල් ලීටරයක මිල රුපියල් 110 දක්වා රුපියල් 23 කින්
- භූමිතෙල් ලීටරයක මිල රුපියල් 65 දක්වා රුපියල් 16 කින්
- කර්මාන්ත සඳහා භාවිතා කරන භූමිතෙල් ලීටරයක මිල රුපියල් 94 දක්වා රුපියල් 16 කින්

2015 ජනවාරි 30 - භූමිතෙල් ලීටරයක සිල්ලර මිල රුපියල් 59 දක්වා රුපියල් 6 කින් අඩු කරන ලදී.

- කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,596 දක්වා රුපියල් 300 කින් අඩු කරන ලදී.

2015 පෙබරවාරි 01 - මගී බස් ගාස්තු සියයට 8.2 ක සාමාන්‍ය ප්‍රතිශතයකින් අඩු කරන ලදී.

2015 පෙබරවාරි 20 - පහත සඳහන් අයිතම සඳහා උපරිම සිල්ලර මිල සීමාවන් පනවන ලදී.

- සාමාන්‍ය පෝට්ලන්ඩ් සිමෙන්ති, පෝට්ලන්ඩ් ලයිම්ස්ටෝන් සිමෙන්ති සහ මේසන් වැඩ සඳහා භාවිතා කරන සිමෙන්ති කිලෝග්‍රෑම් 50 ක බෑගයක් සඳහා රුපියල් 840
- සුදු සීනි (බහාලුම් රහිත) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 87
- සම්පූර්ණ යොදය සහිත කිරිපිටි ග්‍රෑම් 400 අසුරණයක් සඳහා රුපියල් 325 සහ කිලෝග්‍රෑමයක අසුරණයක් සඳහා රුපියල් 810
- සස්ටජන් ග්‍රෑම් 400 අසුරණයක් සඳහා රුපියල් 1,500
- තිරිඟු පිටි (බහාලුම් රහිත) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 87
- මුං ඇට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 265
- වියළි හාල්මැස්සන් (ආනයනික) කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 385
- ටින් මාළු ශුද්ධ බර ග්‍රෑම් 425 ක හෝ දියර රහිත බර ග්‍රෑම් 280 ක් සඳහා රුපියල් 140 සහ ශුද්ධ බර ග්‍රෑම් 155 හෝ දියර රහිත ග්‍රෑම් 105 ක් සඳහා රුපියල් 70
- නොඇඹරූ හෝ කුඩු නොකළ කොත්තමල්ලි ඇට කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 350
- උඳු කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 300
- උම්බලකඩ කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 1,740
- කුඩු කළ හෝ ඇඹරූ කහ කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 800
- කුඩු කළ හෝ ඇඹරූ වියළි මිරිස් කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 400

2015 ජූලි 15 - කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,496 දක්වා රුපියල් 100 කින් අඩු කරන ලදී.

2015 සැප්තැම්බර් 15 - තෙකලා ඇම්පියර් 30 හෝ ඊට වැඩි විදුලි සම්බන්ධතා ඇති ගෘහස්ථ පාරිභෝගිකයින් සඳහා පරිභරණය කරන වේලාව පදනම් කර ගනිමින් විකල්ප අයකුමයක් ලෙස නව විදුලි ගාස්තු අයකුමයක් හඳුන්වා දෙන ලදී. නව විදුලි ගාස්තු ව්‍යුහය පහත පරිදි වේ.

| පරිභරණය කරන වේලාව | විදුලි ගාස්තුව (රුපියල්/කිලෝ වොට් පැය) | ස්ථාවර ගාස්තුව (රුපියල්/මසකට) |
|---|---|---|
| කාර්ය බහුල නොවන (පැය 22:30-05:30) | 13.00 | 540.00 |
| දිවා (පැය 05:30-18:30) | 25.00 | 540.00 |
| කාර්ය බහුල (පැය 18:30-22:30) | 54.00 | 540.00 |

1 2015 වසර තුළ දී මෙන්ම 2016 වසරේ පළමු මාස තුන තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද මෙයට ඇතුළත් වේ.

2 මූර්ත අංශයේ සංවර්ධන කටයුතු සඳහා ලබා දුන් රාජ්‍ය මූල්‍ය දිරිගැන්වීම් පිළිබඳ විස්තර රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඇතුළත් වේ.

2015 නොවැම්බර් 21 - භූමිතෙල් ලීටරයක සිල්ලර මිල රුපියල් 49 දක්වා රුපියල් 10 කින් අඩු කරන ලදී.

- කිලෝග්‍රෑම් 12.5 ගෘහස්ථ එල්.පී.ගෑස් සිලින්ඩරයක මිල රුපියල් 1,346 දක්වා රුපියල් 150 කින් අඩු කරන ලදී.

2016 පෙබරවාරි 01 - දේශීය දුරකථන ඇමතුම් සහ කෙටි පණිවුඩ/බහුමාධ්‍ය පණිවුඩ සඳහා වන පොදු අවම මිල පහත පරිදි නිර්ණය කරන ලදී.

| අයිතමය | අවම මිල (මිනිත්තුවකට රුපියල්) |
|---|---|
| දේශීය ඇමතුම් (මිනිත්තු පදනම් කරගත් ගෙවීම්) | 1.50 |
| දේශීය ඇමතුම් (තත්පර පදනම් කරගත් ගෙවීම්) | 1.80 |
| කෙටි පණිවුඩ/බහුමාධ්‍ය පණිවුඩ | 0.20 (පණිවුඩයකට) |

## විදේශ අංශය

### වෙළඳ සහ තීරු බදු

2015 ජනවාරි 01 - බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී.

2015 ජනවාරි 22 - සහල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 1 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා වැඩි කරන ලදී.

2015 ජනවාරි 30 - සිලින්ඩර ධාරිතාව ඝන සෙන්ටිමීටර 1,000 ට අඩු මෝටර් වාහන සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද අඩු කරන ලද අතර, දෙමුහුන් මෝටර් වාහන සඳහා වන නිෂ්පාදන බද්ද වැඩි කරන ලදී.

- පෝට්ලන්ඩ් සිමෙන්ති සහ යකඩ හෝ මිශ්‍ර ලෝහ නොවන වානේවලින් කළ අර්ධ නිමි භාණ්ඩ තීරු බද්දෙන් නිදහස් කරන ලදී.

- තිරිඟු ඇට ආනයනය සඳහා සියයට 15 ක හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක සම්පූර්ණ තීරු බදු අත්හැරීමක් ලබා දෙන ලදී.

- පහත සඳහන් ආහාර ද්‍රව්‍ය ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයකට අදාළ වන පරිදි අඩු කරන ලදී.
  - උම්බලකඩ කිලෝග්‍රෑමයට රුපියල් 302 සිට කිලෝග්‍රෑමයට රුපියල් 102 දක්වා
  - වියළි හාල්මැස්සන් කිලෝග්‍රෑමයට රුපියල් 26 සිට කිලෝග්‍රෑමයට රුපියල් 11 දක්වා
  - මුං ඇට කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා
  - උඳු කිලෝග්‍රෑමයට රුපියල් 110 සිට කිලෝග්‍රෑමයට රුපියල් 60 දක්වා
  - මිරිස් (අඹරන ලද හෝ කුඩු කළ) කිලෝග්‍රෑමයට රුපියල් 150 සිට කිලෝග්‍රෑමයට රුපියල් 125 දක්වා
  - කොත්තමල්ලි ඇට කිලෝග්‍රෑමයට රුපියල් 46 සිට කිලෝග්‍රෑමයට රුපියල් 26 දක්වා
  - කොත්තමල්ලි (අඹරන ලද හෝ කුඩු කළ) කිලෝග්‍රෑමයට රුපියල් 202 සිට කිලෝග්‍රෑමයට රුපියල් 52 දක්වා
  - කහ (නොඇඹරූ හෝ කුඩු නොකළ) කිලෝග්‍රෑමයට රුපියල් 202 සිට කිලෝග්‍රෑමයට රුපියල් 102 දක්වා
  - කහ (වෙනත්) කිලෝග්‍රෑමයට රුපියල් 510 සිට කිලෝග්‍රෑමයට රුපියල් 360 දක්වා
  - උඳු පිටි කිලෝග්‍රෑමයට රුපියල් 300 සිට කිලෝග්‍රෑමයට රුපියල් 200 දක්වා

| | | |
|---|---|---|
| | - | ටින් මාළු කිලෝග්‍රෑමයට රුපියල් 102 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා |
| | - | සීනි කිලෝග්‍රෑමයට රුපියල් 28 සිට කිලෝග්‍රෑමයට රුපියල් 18 දක්වා |
| 2015 පෙබරවාරි 9 | - | තිරිඟු ඇට ආනයනයේ දී ලබා දී තිබූ තීරු බදු අත්හැරීම සියයට 15 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 4 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, තිරිඟු ඇට සඳහා අදාළ වන තීරු බදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 6 කි. |
| 2015 පෙබරවාරි 15 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. |
| | - | මැකරල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2015 පෙබරවාරි 25 | - | මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, මයිසූර් පරිප්පු, කුරක්කන්, මිලට් සහ මාජරින් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| | - | ඉරිඟු සහ ඉදල් ඉරිඟු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අවලංගු කරන ලදී. |
| 2015 පෙබරවාරි 27 | - | මෝටර් රථ සහ ප්‍රධාන වශයෙන් මගී ප්‍රවාහනය සඳහා වූ අනෙකුත් මෝටර් වාහන ආනයනය කිරීමේ දී එසේ ආනයනය කළ හැකි වාහනවල වයස් සීමාව වැඩි කරන ලදී. |
| 2015 මාර්තු 18 | - | මැකරල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 6 දක්වා අඩු කරන ලදී. |
| 2015 මාර්තු 26 | - | සහල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 20 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. |
| 2015 අප්‍රේල් 02 | - | අලුත් හෝ ශීතකළ මසුන්, කරවල, යෝගට්, බටර්, කිරිවලින් නිපදවූ තැවරුම්, රතුළූණු, සුදු ළූණු, අලුත් දොඩම්, මිදි, ඇපල්, සූදුරු බීජ, මහදුරු බීජ, උළුහාල් ඇට, කුරක්කන් පිටි, රටකජු, අබ ඇට, එළවළු තෙල් සහ ලුණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2015 අප්‍රේල් 24 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 55 දක්වා වැඩි කරන ලදී. |
| | - | බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| 2015 මැයි 06 | - | සහල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 40 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද වෙනුවට කිලෝග්‍රෑමයට රුපියල් 35 ක ආනයන තීරු බද්ද, සියයට 11 ක එකතු කළ අගය මත බද්ද, සියයට 5 ක වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සියයට 2 ක ජාතිය ගොඩනැගීමේ බද්ද පනවන ලදී. |
| 2015 ජුනි 06 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 55 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා අඩු කරන ලදී. |
| | - | බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී. |

| | | |
|---|---|---|
| 2015 ජුනි 17 | - | පියලි කළ රතු සහ කහ මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 0.25 දක්වා අඩු කරන ලදී. |
| | - | ශුද්ධ නොකළ සෝයා බෝංචි තෙල්, පාම් තෙල් සහ සූර්යකාන්ත තෙල් සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 90 සිට කිලෝග්‍රෑමයට රුපියල් 105 දක්වා වැඩි කරන ලදී. |
| | - | අනෙකුත් එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2015 ජුනි 29 | - | ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි සියයට 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 2015 ජූලි 21 | - | ශුද්ධ නොකළ සෝයා බෝංචි තෙල්, පාම් තෙල් සහ සූර්යකාන්ත තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 105 සිට කිලෝග්‍රෑමයට රුපියල් 90 දක්වා අඩු කරන ලදී. |
| | - | උම්බලකඩ, වියළි හාල්මැස්සන්, මුං ඇට, උඳු, මිරිස්, කොත්තමල්ලි, කහ, උඳු පිටි, ශුද්ධ නොකළ එළවළු තෙල් හැර අනෙක් එළවළු තෙල්, ටින් මාළු සහ සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2015 ජූලි 23 | - | කිරි පිටි ආනයනයේ දී ලබා දී තිබූ තීරු බදු අත්හැරීම කිලෝග්‍රෑමයට රුපියල් 90 සිට කිලෝග්‍රෑමයට රුපියල් 45 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතය කිලෝග්‍රෑමයට රුපියල් 180 කි. |
| 2015 අගෝස්තු 06 | - | කිරි පිටි ආනයනයේ දී ලබා දී තිබූ තීරු බදු අත්හැරීම ඉවත් කරන ලදී. කිරි පිටි සඳහා අය කළ තීරු බද්ද සියයට 25 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 225 සිට සියයට 20 හෝ කිලෝග්‍රෑමයට රුපියල් 225 දක්වා අඩු කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 08 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලය සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා වැඩි කරන ලදී. |
| | - | සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 18 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| | - | බොම්බයි ළූණු, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, මයිසූර් පරිප්පු (සම්පූර්ණ - රතු සහ කහ පරිප්පු), මිලට්, කුරක්කන්, මාජරින් සහ සීනි ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 18 | - | මැකරල් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 6 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 22 | - | 2015 ඔක්තෝබර් 08 දක්වා බලපැවැත්වෙන පරිදි බොම්බයි ළූණු ආනයනය සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 20 ක අධිභාරයක් පනවන ලදී. |
| 2015 සැප්තැම්බර් 23 | - | පහත සඳහන් අයිතම ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයකට අදාළ වන පරිදි වැඩි කරන ලදී.<br>- ශුද්ධ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ සෝයා බෝංචි තෙල්, පාම් තෙල් සහ සූර්යකාන්ත තෙල් සහ ඒවායේ ඉතිරි කොටස්<br>- ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ තෙල් (කොප්පරා), පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් |

| | | |
|---|---|---|
| 2015 ඔක්තෝබර් 02 | - | අලුත් හෝ ශීතකළ මසුන්, කරවල, යෝගට්, බටර්, කිරිවලින් නිපදවූ තැවරුම්, රතුළූණු, සුදු ළූණු, අලුත් දොඩම්, මිදි, ඇපල්, සූදුරු බීජ, මහදුරු බීජ, උළුහාල් ඇට, කුරක්කන් පිටි, රටකජු, අබ ඇට සහ ලූණු ආනයන සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 09 | - | බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 10 සිට කිලෝග්‍රෑමයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 19 | - | මෝටර් වාහන ආනයනයේ දී ගෙවිය යුතු නිෂ්පාදන බදු ගණනය කිරීම සඳහා වූ ආනයන වටිනාකම ගණනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 29 | - | ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා අය කළ සියයට 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් ආනයනය කිරීම සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 175 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ඉදිරි මාස තුනක කාලයක් සඳහා පනවන ලදී. |
| 2015 නොවැම්බර් 21 | - | අලුත් හෝ ශීත කළ මසුන් සහ හිමායිත මසුන් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි සියයට 10 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 10 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණයේ සිට සියයට 10 ක් හෝ කිලෝග්‍රෑමයට රුපියල් 50 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය දක්වා වැඩි කරන ලදී. |
| | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 15 දක්වා අඩු කරන ලදී. |
| | - | බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 30 සිට කිලෝග්‍රෑමයට රුපියල් 5 දක්වා අඩු කරන ලදී. |
| | - | සම්පූර්ණ ඇට සහිත රතු සහ කහ මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 2 සිට කිලෝග්‍රෑමයට රුපියල් 0.25 දක්වා අඩු කරන ලදී. |
| | - | පියලි කළ රතු සහ කහ මයිසූර් පරිප්පු ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 0.25 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| | - | අලුත් සහ වියළි රටඉඳි ආනයනය කිරීම සඳහා කිලෝග්‍රෑමයට රුපියල් 60 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් ඉදිරි මාස හයක කාලයක් සඳහා පනවන ලදී. |
| | - | ශුන්‍යය, සියයට 7.5, සියයට 15 සහ සියයට 25 ලෙස ස්ථර හතරකින් පැවති ආනයන තීරු බදු ව්‍යුහය වෙනුවට ශුන්‍යය, සියයට 15 සහ සියයට 30 යන ස්ථර තුනකින් සමන්විත ආනයන බදු ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී. |
| | - | මධ්‍යපාන, අඟල් 20 ට නොඅඩු පට්ටම් සහිත ටයර්, චොක්ලට් කුට්ටි (බ්ලොක්) සඳහා වූ ආනයන තීරු බදු වැඩි කරන ලදී. |
| | - | රෙදිපිළි, පාවහන්, පිඟන් ගඩොල්, වානේ, සංගීත භාණ්ඩ සහ පොතුහරින ලද හා ඇඹරූ බඩ ඉරිඟු සඳහා වූ ආනයන තීරු බදු අඩු කරන ලදී. |
| 2016 ජනවාරි 21 | - | උම්බලකඩ, වියළි හාල්මැස්සන්, මුං ඇට, උඳු, මිරිස්, කොත්තමල්ලි බීජ, කහ, උඳු පිටි සහ ටින් මාළු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2016 ජනවාරි 29 | - | ඉරිඟු සහ ඉදල් ඉරිඟු ඇට (සෝගම්) ආනයනය සඳහා අය කළ සියයට 10 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 පෙබරවාරි 29 දක්වා දීර්ඝ කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | ශාකමය මේද සහ තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් ආනයනය සඳහා අය කළ කිලෝග්‍රෑමයට රුපියල් 175 ක් වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2016 අප්‍රේල් 28 දක්වා දීර්ඝ කරන ලදී. |
| 2016 පෙබරවාරි 01 | - | සහල් ආනයනය සඳහා අය කළ ආනයන තීරු බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 35 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා වැඩි කරන ලදී. |
| 2016 මාර්තු 01 | - | අර්තාපල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 35 දක්වා වැඩි කරන ලදී. |
| | - | බොම්බයි ළූණු ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉදිරි මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 5 සිට කිලෝග්‍රෑමයට රුපියල් 25 දක්වා වැඩි කරන ලදී. |
| 2016 මාර්තු 08 | - | මැකරල්, මෑ වර්ගයේ ඇට, කොණ්ඩ කඩල, කව්පි, කුරක්කන්, මාගරින්, සීනි සහ එළවළු තෙල් ආනයනය සඳහා අය කළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2015 නොවැම්බර් 01 | - | විදේශ රටවලට සංක්‍රමණය වන ශ්‍රී ලාංකිකයන් විසින් රටින් පිටතට ගෙන යන විදේශ විනිමය සඳහා සංක්‍රමණය වන අවස්ථාවේ දී සියයට 20 ක බද්දක් අය කරන ලදී. |
| 2015 දෙසැම්බර් 29 | - | අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RFC), අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (RNNFC) සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (FEEA) පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට එම ගිණුම්වල පවත්නා අරමුදල් භාවිතා කරමින් ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කරන ලද සුරැකුම්පත් අත්පත් කර ගැනීමට, දැරීමට හා පැවරීමට, ප්‍රාග්ධන ස්වරූපයේ වෙනත් ඕනෑම වත්කමක් අත්පත් කර ගැනීමට සහ ජංගම ගිණුම් (ප්‍රාග්ධන නොවන) ගනුදෙනු සම්බන්ධයෙන් ගෙවීම් කිරීමට අවසර ලබා දෙන ලදී. |
| | - | ඉහත ආකාරයට අත්පත් කර ගන්නා ලද, දරන ලද හෝ පවරන ලද සුරැකුම්පත් සහ ප්‍රාග්ධන ස්වරූපයේ අනෙකුත් වත්කම් පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවට දැනුම් දීම සඳහා වන අවශ්‍යතාවයන්ගෙන් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් නිදහස් කරන ලදී. |
| 2016 ජනවාරි 20 | - | අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් හිමියන් හට එම ගිණුම්වල පවතින මුදල් ඉහත ලිහිල්කිරීම් ප්‍රකාරව ඕනෑම අරමුණක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීමට ඉඩ සලසමින් එම ගිණුම් සම්බන්ධ විධිවිධානයන් බලයලත් වෙළඳුන් හට නිකුත් කරන ලදී. |
| **අපේක්ෂිත** | - | නව විදේශ විනිමය කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම |
| | - | ඇපයෙන් සීමිත සමාගම් හා විදේශ සමාගම් හැර ශ්‍රී ලංකාවේ ස්ථාපිත ඕනෑම සමාගමක් හට විදේශ මූලාශ්‍රයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා ඉඩ සලසමින් නව ණය ගැනීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම |
| | - | ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කරනු ලබන සීමා හා ක්ෂේත්‍ර පුළුල් කිරීම හරහා රජයේ ප්‍රතිපත්තිය හා සමගාමීව ආමුඛ ආයෝජන ප්‍රතිපත්ති නැවත සමාලෝචනය කිරීම |
| | - | විගමනිකයන්ගේ ජංගම ආදායම් හා විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කිරීම සඳහා පොදු අවසරයක් ලබා දීම |

## රාජ්‍ය මූල්‍ය අංශය

### රාජ්‍ය ආදායම

2015 ජනවාරි 01

- එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 12 සිට සියයට 11 දක්වා අඩු කරන ලදී.
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් නම් කරන ලද විශේෂිත වූ වරායයන් තුළ භාවිතා කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ අමතර කොටස් ආනයනය කිරීම එකතු කළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
- එකතු කළ අගය මත බද්දෙන් සහ ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් ආනයනික සාම්පල වටිනාකම රුපියල් 25,000 සිට රුපියල් 50,000 දක්වා වැඩි කරන ලදී.
- තොග සහ සිල්ලර වෙළඳාම මත එකතු කළ අගය මත බදු අය කිරීම සඳහා පැවතිය යුතු විකුණුම් වටිනාකම කාර්තුවකට රුපියල් මිලියන 250 සිට රුපියල් මිලියන 100 දක්වා අඩු කරන ලදී.
- එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය සැපයුම් සීමාව වර්ෂයකට රුපියල් මිලියන 12 සිට වර්ෂයකට රුපියල් මිලියන 15 දක්වා වැඩි කරන ලදී.
- ජාතිය ගොඩනැගීමේ බද්දෙන් නිදහස් පිරිවැටුම් සීමාව කාර්තුවකට රුපියල් මිලියන 3 සිට කාර්තුවකට රුපියල් මිලියන 3.75 දක්වා වැඩි කරන ලදී.
- ඔට්ටු සහ සූදු ක්‍රීඩාවේ බුකීකරුවෙකුගෙන් හෝ සූදු ව්‍යාපාරයෙන් අය කර ගනු ලබන දළ පිරිවැටුම මත අය කරන බද්ද සියයට 5 සිට සියයට 10 දක්වා වැඩි කරන ලදී.
- කැසිනෝ විනෝදාස්වාද මධ්‍යස්ථානයකට ඇතුලුවන සෑම පුද්ගලයෙකුටම එ.ජ. ඩොලර් 100 ක ප්‍රවේශ ගාස්තුවක් පනවන ලදී.

2015 අප්‍රේල් 01

- පහත සඳහන් පුද්ගලයන්/ආයතන සඳහා වන ලාභ සහ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
  - 2015 ජනවාරි 01 දින හෝ ඊට පසු එ.ජ. ඩොලර්වලින් වටිනාකම නියම කෙරෙන තැන්පතු හෝ විදේශීය කොටස් හුවමාරුවල ලැයිස්තුගත කෙරෙන සුරැකුම්වල ආයෝජනය කිරීමෙන් යම් ඒකක භාරයකට ලැබෙන ලාභ සහ ආදායම්
  - තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශ්වයන්ට පැවරීමේ (IT/BPO) සේවා සපයන යම් සමාගමක් එම සමාගම ආරම්භ කර වසර දෙකක කාල සීමාවක් තුළ විශේෂ අවශ්‍යතාවක් අනුව රාජ්‍ය භාග ලෙස කරනු ලබන යම් ගෙවීමකින් ශ්‍රී ලංකාවෙන් පිට යම් සමාගමකට, හවුල් ව්‍යාපාරයකට හෝ පුද්ගල මණ්ඩලයකට ලැබෙන ලාභ සහ ආදායම්
  - නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සාංගමික ණය සුරැකුම්පතක 2015 ජනවාරි 01 දින හෝ ඊට පසුව කරනු ලබන ආයෝජන
- පහත දැක්වෙන සහනදායී ආදායම් බදු අනුපාත හඳුන්වා දෙන ලදී.
  - 1970 දශකයේ දී නිෂ්පාදන ව්‍යාපාර ආරම්භ කරන ලද දේශීය නිෂ්පාදකයන් ගෙවිය යුතු ආදායම් බද්දෙන් සියයට 10 ක් අඩු කිරීම
  - දේශීය සීනි කර්මාන්තය සඳහා සියයට 12 ක සහනදායී බදු අනුපාතයක්
  - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සියයට 12 ක සහනදායී බදු අනුපාතය සඳහා සුදුසුකම් ලැබීමේ වාර්ෂික පිරිවැටුම් සීමාව රුපියල් මිලියන 500 සිට රුපියල් මිලියන 750 දක්වා ඉහළ නැංවීම
  - ජාත්‍යන්තර චිත්‍රපට/නාට්‍ය උළෙලක දී සම්මානලාභී චිත්‍රපටයක් හෝ නාට්‍යයක් නිපදවන පුද්ගලයෙකුගේ චිත්‍රපට/නාට්‍ය නිෂ්පාදනයෙන් ලැබෙන ලාභ සහ ආදායමෙන් අඩක් අදාළ සම්මානය ලැබූ වසරේ සිට වසර පහක් දක්වා බද්දෙන් නිදහස් කිරීම
  - ක්ෂේත්‍ර කිහිපයක සේවා නියුක්ති ආදායම මත අදාළ වූ සියයට 16 ක උපරිම බදු අනුපාතය අනෙකුත් සේවා නියුක්ති කාණ්ඩවලට ද ලබා දීම

- එ.ජ. ඩොලර් මිලියන 2 කට නොඅඩු ආයෝජනයක් සහිත අපනයන සඳහා භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින නව ව්‍යවසායයන් සඳහා ස්ථාවර වත්කම් අත්කර ගැනීම මත ක්ෂය දීමනා එකවර අඩු කිරීමට ඉඩ දෙන අතර එම ලාභයෙන් බෙදා හරිනු ලබන ලාභාංශ වසර පහක කාලයක් දක්වා ආදායම් බද්දෙන් නිදහස් කිරීම
- මත්පැන් සහ දුම්කොළ හැර භාණ්ඩ නිෂ්පාදනයේ යෙදී සිටින යම් ව්‍යාපාරයක් බස්නාහිර පළාත හැර වෙනත් පළාතකට ව්‍යාප්ත කරන්නේ නම් කොන්දේසි කිහිපයක් යටතේ වසර පහක කාලසීමාවක් සඳහා එම ව්‍යාපාරයේ ලාභ සහ ආදායම් මත බදු අනුප්‍රමාණය සියයට 50 කින් රුපියල් මිලියන 500 නොඉක්මවන ප්‍රමාණයක් දක්වා අඩු කිරීම
- දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති ඕනෑම නිෂ්පාදන ව්‍යාපාරයක රුපියල් මිලියන 500 ක් ඉක්මවන එකඟ වූ ආයෝජනයක් සහිතව 2015 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර බදු ගෙවීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වන යම් සමාගමක් වසර 7 ක් දක්වා අදාළ බදු අනුප්‍රමාණයෙන් සියයට 50 ක අඩු කිරීමක් සඳහා හිමිකම් ලබා දීම

- පොලී ආදායම් ප්‍රමාණය නොසලකා සියයට 2.5 ක තනි රඳවා ගැනීමේ බදු ප්‍රතිශතයක් හඳුන්වා දෙන ලදී.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොලී ආදායම් රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරන ලදී.
- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසම යටතේ ලියාපදිංචි වී ඇති ඕනෑම තැනැත්තෙකු විසින් පුහුණුවන්නන් සඳහා පිළිගත් හැකියා ප්‍රවර්ධන පුහුණුවක් ලබාදීම සඳහා දරනු ලැබූ යම් වියදමක් වෙනුවෙන් එම වියදම මෙන් තුන් ගුණයක් බදු අය කළ හැකි ආදායමෙන් අඩු කිරීමට ඉඩ ලබා දෙන ලදී.
- උපයන විට ගෙවීමේ බදු සඳහා වන බදු නිදහස් සීමාව (වාර්ෂික සේවා නියුක්ති ආදායම) රුපියල් 600,000 සිට රුපියල් 750,000 දක්වා ඉහළ නංවන ලද අතර උපයන විට ගෙවීම් බදු අනුපාතිකය සියයට 24 සිට සියයට 16 දක්වා අඩු කරන ලදී.
- මත්පැන් අලෙවි කරන තොග සහ සිල්ලර වෙළඳ මධ්‍යස්ථාන, හෝටල්, හෝටල් පීඨිකා, භෝජනාගාර සඳහා අදාළ වාර්ෂික මත්පැන් බලපත්‍ර ගාස්තු වැඩි කරන ලදී.

2015 ඔක්තෝබර් 03

- සිගරට් ආනයනය සඳහා වන නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු වැඩි කරන ලදී.
- ශ්‍රී ලංකාව තුළ නිපදවනු ලබන ඉක්ෂුපාක, තල්, පොල් හා පදම් කළ අරක්කු, මෙරට සෑදූ විදේශීය ස්ප්‍රීතු සහ ධාන්‍ය මත්පැන් සඳහා වන සුරාබදු වැඩි කරන ලදී.

2015 ඔක්තෝබර් 30

- තැබෑරුම් සහ මත්පැන් අලෙවිසැල් සඳහා එක්වරක් පමණක් ගෙවිය යුතු රුපියල් 250,000 ක මත්පැන් අලෙවිසැල් සහ තැබෑරුම් අය බද්ද පනවන ලදී.
- සියලු කැසිනෝ ව්‍යාපාරිකයන් සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 1,000 කැසිනෝ කර්මාන්ත අය බද්ද පනවන ලදී.
- බලපත්‍රලාභී ජංගම දුරකථන ක්‍රියාකරුවන් වෙත එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 250 ක ජංගම දුරකථන ක්‍රියාකරු අය බද්ද පනවන ලදී.
- ශ්‍රී ලංකාවේ චන්ද්‍රිකා මධ්‍යස්ථාන භාවිතා කරන චන්ද්‍රිකා අයිතිකරුවන් වෙත එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 1,000 ක චන්ද්‍රිකා ස්ථාන අය බද්ද පනවන ලදී.
- සන්නිවේදන මධ්‍යස්ථාන 5 කට වඩා ඇති දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන ක්‍රීඩා සඳහා පමණක් වූ නාලිකාවලට එක් වරක් පමණක් ගෙවිය යුතු රුපියල් මිලියන 1,000 ක ක්‍රීඩා සඳහා වෙන් වූ නාලිකා අය බද්ද පනවන ලදී.
- රුපියල් මිලියන 150 කට නොඅඩු වටිනාකමකට තක්සේරු කර ඇති හෝ වර්ග අඩි 10,000 ට වැඩි ඉඩකඩ පවතින, 2000 අප්‍රේල් 01 හෝ ඊට පසුව ගොඩනගන ලද නිවාස මත වාර්ෂිකව රුපියල් මිලියන 1 ක මන්දිර බද්දක් පනවන ලදී.

| | | |
|---|---|---|
| | - | 2013/2014 බදු වර්ෂය තුළ රුපියල් මිලියන 2,000 කට අධික ලාභයක් උපයන ලද ඕනෑම පුද්ගලයෙකුගේ හෝ සමාගමක ලාභය මත සියයට 25 ක සුපිරි වාසි බද්දක් (Super Gain Tax) පනවන ලදී. |
| 2015 නොවැම්බර් 21 | - | ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත ඉක්ෂුපාක, තල්, පොල් හා පදම් කළ අරක්කු, විදේශීය ස්ප්‍රීතු සහ නිරපේක්ෂ සැර සියයට පහ හෝ ඊට වැඩි ධාන්‍ය මත්පැන් සඳහා වන සුරාබදු වැඩි කරන ලදී. |
| | - | නිරපේක්ෂ සැර සියයට පහකට වඩා අඩු ධාන්‍ය මත්පැන් සඳහා වන සුරා බද්ද ලීටරයට රුපියල් 190 සිට ලීටරයට රුපියල් 160 දක්වා අඩු කරන ලදී. |
| | - | දිග මිලි මීටර් 72 ට වැඩි නමුත් දිග මිලි මීටර් 84 ට නොවැඩි සිගරට් සහ දිග මිලි මීටර් 84 ට වැඩි සිගරට් සඳහා වන නිෂ්පාදන බදු වැඩි කරන ලදී. |
| | - | මෝටර් වාහන මත වූ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු සංශෝධනය කරන ලද අතර සන සෙන්ටිමීටර අගය පදනම් කරගත් සරල තනි නිෂ්පාදන බදු අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. |
| 2015 නොවැම්බර් 25 | - | ආනයනය කරන ලද ස්වර්ණාභරණ සඳහා සියයට 10 ක සෙස් බද්දක් පනවන ලදී. |
| 2015 දෙසැම්බර් 05 | - | නිරපේක්ෂ සැර සියයට පහකට වඩා අඩු ධාන්‍ය මත්පැන් සඳහා වන සුරා බද්ද ලීටරයට රුපියල් 160 සිට ලීටරයට රුපියල් 190 දක්වා වැඩි කරන ලදී. |
| 2015 දෙසැම්බර් 10 | - | කුළු බඩු අපනයනය සඳහා වූ සෙස් බදු ඉවත් කරන ලදී. |
| 2015 දෙසැම්බර් 13 | - | බීඩි කොළ, තාප මර්ධන සිමෙන්ති, වාත්තු අච්චු හෝ මධ්‍ය කුහර සඳහා සකස් කළ බැඳුම් වර්ග, ජල මූල සහ බහු අවයවික වර්ග, පාටිකල් ලෑලි, ඔරියන්ටඩ් ස්ටෑන්ඩඩ් ලෑලි හා එවැනි ලෑලි, සිනිඳු දැල් රෙදි හා අනෙකුත් දැල් රෙදි සහ ශීතකරණ කැබිනට් ආනයනය සඳහා අය කළ සෙස් බද්ද අඩු කරන ලදී. |
| | - | ස්නේහක තෙල් (Lubricants), විනිල් ඇසිටේට් බහු අවයවික සහ ප්‍රාථමික ස්වරූප දරන ඇක්රිලිප් බහු අවයවික, දිය නාල්ලන පාවහන් සහ අනෙකුත් පාවහන් ආනයනය සඳහා අය කළ සෙස් බදු වැඩි කරන ලදී. |
| 2015 දෙසැම්බර් 15 | - | මත්පැන් නිෂ්පාදකයන් සහ ස්කාගාර සඳහා වන වාර්ෂික බලපත්‍ර ගාස්තුව වැඩි කරන ලදී. |
| 2015 දෙසැම්බර් 31 | - | මධ්‍යසාර භාවිතය සඳහා තරු ගණයේ හෝටල්, බුටික් හෝටල්, බුටික් විලා සහ පෞරාණික වැදගත්කමක් ඇති හෝටල් සඳහා අය කරනු ලබන තුන් අවුරුදු ගාස්තුව වැඩි කරන ලදී. |
| 2016 ජනවාරි 01 | - | මෝටර් වාහන ආනයනය කර විකිණීමේ ව්‍යාපාරයන්හි නිරත සියලුම ආනයනකරුවන් සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 1.5 ක ආනයන බලපත්‍ර ගාස්තුවක් අය කරන ලදී. |
| | - | බෝතල් කරන ලද රා සඳහා අය කළ බද්ද ලීටරයට රුපියල් 10 සිට ලීටරයට රුපියල් 30 දක්වා වැඩි කරන ලදී. |
| | - | ණය කාඩ්පත් භාවිතය මත පැවති සියයට 1.5 ක මුද්දර ගාස්තුව, ණය කාඩ්පත් දේශීය වශයෙන් භාවිතය මත පමණක් ඉවත් කරන ලදී. |
| | - | විදේශීය මිලදී ගැනීම් සඳහා ණය කාඩ්පත් භාවිතා කිරීම වෙනුවෙන් මුද්දර ගාස්තුව සියයට 2.5 දක්වා වැඩි කරන ලදී. |
| | - | යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක් සඳහා වන මුද්දර ගාස්තු ඉවත් කරන ලදී. |
| | - | අපගමන බදු පහත පරිදි වැඩි කරන ලදී.<br>- ගුවන් යානයකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන තැනැත්තෙක් සඳහා එ.ජ. ඩොලර් 25 සිට එ.ජ. ඩොලර් 30 දක්වා.<br>- නැව් මගින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන තැනැත්තෙක් සඳහා එ.ජ. ඩොලර් 5 සිට එ.ජ. ඩොලර් 30 දක්වා. |
| | - | විදේශ ගමන් බලපත්‍ර ගාස්තුව සහ ද්විත්ව පුරවැසිභාවය සඳහා වන ගාස්තුව වැඩි කරන ලදී. |

| | | |
|---|---|---|
| | - | වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද සියයට 5 සිට සියයට 7.5 දක්වා වැඩි කරන ලදී. |
| | - | වාහන හිමිකම් බද්ද හඳුන්වා දෙන ලදී. |
| | - | විදේශිකයන් හට ඉඩම් බදු දීමේ දී අය කළ බද්ද ඉවත් කරන ලදී. |
| | - | ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද ඉවත් කරන ලදී. |
| | - | ලැබෙන ඇමතුම් මත ජාත්‍යන්තර විදුලි සංදේශ නියාමන ගාස්තුව එ.ජ. ඩොලර් ශත 9 සිට එ.ජ. ඩොලර් ශත 12 දක්වා වැඩි කරන ලදී. |
| | - | ඉලෙක්ට්‍රොනික් සහ විද්‍යුත් අයිතම සඳහා සියයට 2.5 ක සහනදායී වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. |
| | - | ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදා ගන්නා යන්ත්‍ර සූත්‍ර වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී. |
| **රාජ්‍ය වියදම** | | |
| 2015 ජනවාරි 01 | - | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 29 දිනැති චක්‍රලේඛ අංක 2014/14 අනුව උපරිම සමෘද්ධි දීමනාව මසකට රුපියල් 1,500 සිට මසකට රුපියල් 3,000 දක්වා වැඩි කරන ලදී. |
| 2015 පෙබරවාරි 01 | - | රජයේ සේවකයන්ගේ වැටුප මසකට රුපියල් 7,000 කින් වැඩි කරන ලදී. ඉන් රුපියල් 5,000 ක් 2015 පෙබරවාරි මාසයේ සිට ලබා දුන් අතර, ඉතිරිය ජුනි මාසයේ සිට ලබා දෙන ලදී. |
| 2015 අප්‍රේල් 01 | - | විශ්‍රාමිකයන් සඳහා ගෙවන ලද මාසික අතුරු දීමනාව මසකට රුපියල් 3,500 දක්වා රුපියල් 1,000 කින් වැඩි කරන ලදී. |
| 2015 අප්‍රේල් 30 | - | උපරිම සමෘද්ධි දීමනාව මසකට රුපියල් 3,000 සිට මසකට රුපියල් 3,500 දක්වා ඉහළ නංවන ලදී. |
| 2015 ජූලි 01 | - | රජයේ සේවකයින්ගේ වැටුප් සංශෝධනය කරමින් නිකුත් කරන ලද 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2006 සහ 2007 අගෝස්තු 24 දිනැති චක්‍රලේඛ අංක 06/2006 (IV) ක්‍රියාත්මක කිරීමට පෙර විශ්‍රාම ලැබූ රජයේ සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ඉහත චක්‍රලේඛවල වැටුප් සංශෝධන පදනම් කර ගනිමින් නැවත සංශෝධනය කරන ලදී. |
| | - | විධායක සේවා ශ්‍රේණියේ සේවයේ නියුතු රජයේ සේවකයන්ට පහත සඳහන් ආකාරයට විශේෂ දීමනාවක් ලබා දෙන ලදී. |

| කාණ්ඩය | මාසික දීමනාව (රුපියල්) |
|---|---|
| සක්‍රීය සේවා කාලය අවුරුදු 6 ට අඩු | 3,000 |
| සක්‍රීය සේවා කාලය අවුරුදු 6 ට වැඩි එහෙත් 11 ට අඩු | 5,000 |
| සක්‍රීය සේවා කාලය අවුරුදු 11 ට වැඩි එහෙත් 19 ට අඩු | 10,000 |
| අවු 19 ට වැඩි සේවා කාලයක් සහිත 1 ශ්‍රේණියේ සහ ඊට ඉහළ ශ්‍රේණිවල නිලධාරීන් | 15,000 |

| | | |
|---|---|---|
| 2016 පෙබරවාරි 25 | - | 2006 අප්‍රේල් 25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 සහ එයට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන යටතේ රාජ්‍ය සේවයේ තනතුරු සඳහා ක්‍රියාත්මක වන වැටුප් පරිමාණයන් සංශෝධනය කර 2016 ජනවාරි 01 දින සිට අදියර පහකින් යුතු වැටුප් පරිමාණයන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 නිකුත් කරන ලදී. |
| **අපේක්ෂිත** | - | පොහොර සහනාධාරය ලෙස වාර්ෂිකව වී ගොවීන්ට හෙක්ටයාරයකට රුපියල් 25,000 ක මූල්‍යමය ආධාරයක් ලබා දීම |

**රාජ්‍ය ණය කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2015 ජනවාරි 19 | - | 2015 වර්ෂය සඳහා එ.ජ. ඩොලර් මිලියන 1,500 ක සීමාවක් දක්වා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2015 පෙබරවාරි 09 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර පාවෙන පොලී අනුපාතයට නිකුත් කිරීමට අමතරව ස්ථාවර පොලී අනුපාතයට, විවිධ කල්පිරීම් කාලයන්ගෙන් යුක්තව නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී. |
| 2015 ජූනි 10 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා 2015 වර්ෂය සඳහා වන අනුමත නිකුතු සීමාව එ.ජ. ඩොලර් මිලියන 2,500 දක්වා ඉහළ දමන ලදී. |
| 2015 ඔක්තෝබර් 05 | - | ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා වන ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු හා නීතිමය හිමිකම් සටහන් කිරීම් නිර්ලේඛිතව සිදු කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියේ බහු මුදල් ක්‍රියාකාරිත්වය සක්‍රීය කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 20 | - | රුපියල් බිලියන 850 ක් වූ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ සීමාව රුපියල් බිලියන 1,250 දක්වා වැඩි කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 28 | - | ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන 300 සිට රුපියල් මිලියන 1,000 දක්වා ඉහළ දමමින්, අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාව පිළිබඳව වූ විධිවිධානය සංශෝධනය කරන ලදී. |
| | - | ප්‍රාථමික අලෙවිකරුවන් විසින් පවත්වා ගත යුතු අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතයෙහි අවමය සියයට 8 සිට සියයට 10 දක්වා ඉහළ දමමින්, ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතය පිළිබඳව වූ විධිවිධානය සංශෝධනය කරන ලදී. |
| 2015 දෙසැම්බර් 04 | - | භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශිකයන්ට ආයෝජනය කළ හැකි සීමාව නොපියවූ මුළු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකමින්, සියයට 12.5 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී. |

## මුදල් අංශය

| | | |
|---|---|---|
| 2015 මාර්තු 02 | - | සියයට 5.00 ක් වූ විශේෂ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය ඉවත් කරන ලදී. |
| 2015 අප්‍රේල් 15 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.00 සහ සියයට 7.50 දක්වා පදනම් අංක 50 කින් අඩු කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 03 | - | වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් අනුව විනිමය අනුපාතික තීරණය වීමට ඉඩ හරින ලදී. |
| 2015 දෙසැම්බර් 30 | - | 2016 ජනවාරි මස 16 වන දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව සියයට 6.00 සිට සියයට 7.50 දක්වා ප්‍රතිශතාංක 1.50 කින් වැඩි කරන ලදී. |
| 2016 පෙබරවාරි 19 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පිළිවෙළින් සියයට 6.50 සහ සියයට 8.00 දක්වා පදනම් අංක 50 කින් වැඩි කරන ලදී. |

## මූල්‍ය අංශය

**ලියාපදිංචි බැංකු**

| | | |
|---|---|---|
| 2015 ජනවාරි 01 | - | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ එක් ආයතනයක එක් තැන්පතු හිමියකු සඳහා වන තැන්පතු රක්ෂණ ආවරණය රුපියල් 200,000 සිට රුපියල් 300,000 දක්වා ඉහළ නංවන ලදී. |
| 2015 පෙබරවාරි 01 | - | 2015 ජනවාරි 31 දින හෝ ඊට පෙර අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති, රාජ්‍ය බැංකු විසින් ගොවීන් වෙත ප්‍රදානය කළ රුපියල් 100,000 ක උපරිමයක් දක්වා වන වගා ණයවලින් සියයට 50 ක් කපා හරින ලදී. |

| | | |
|---|---|---|
| 2015 මාර්තු 13 | - | වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින්, වසරක කාලසීමාවක් සඳහා ආරම්භ කරනු ලබන රුපියල් මිලියන 1 දක්වා වූ රුපියල් ස්ථාවර තැන්පතු සඳහා 2015 ජනවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වසරකට සියයට 15 ක පොලී අනුපාතිකයක් සහ 2015 ජනවාරි 16 දිනට පෙර ආරම්භ කරන ලද රුපියල් මිලියන 2.5 දක්වා රුපියල් ස්ථාවර තැන්පතු සඳහා වසරකට සියයට 12 ක පොලී අනුපාතිකයක් ලබා දෙන ලදී. |
| 2015 මාර්තු 15 | - | 2015 ජනවාරි 31 දින හෝ එයට පෙර අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති, රාජ්‍ය බැංකු විසින් ප්‍රදානය කළ රුපියල් 200,000 දක්වා උකස් අත්තිකාරම් 2015 ජුනි 30 හෝ එයට පෙර පියවනු ලබන අවස්ථාවන්හි දී එවැනි අත්තිකාරම් සම්බන්ධයෙන් සියයට 12 ඉක්මවා අය කර ඇති ණය පොලිය කපා හරින ලදී. |
| 2015 මාර්තු 31 | - | 2015 අප්‍රේල් මස 01 දින සිට බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ ද්‍රවශීලතා ආවරණ අනුපාතය ක්‍රියාවට නැංවීම පිළිබඳ විධිවිධානයන් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2015 අප්‍රේල් 15 | - | බැංකු සේවා ලබා ගැනීමට ඇති ඉඩප්‍රස්ථා පුළුල් කිරීම සම්බන්ධයෙන් 2015 සඳහා වූ අතුරු අයවැය යටතේ ඉදිරිපත් කළ යෝජනා පිළිබඳව බලපත්‍රලාභී බැංකු දැනුම්වත් කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2015 ජුනි 01 | - | අපනයනකරුවන් වෙත ප්‍රදානය කරන ලද ණය පහසුකම් ආපසු ගෙවීමේ දී සිදුවන ප්‍රමාදවීම් සඳහා පනවා තිබූ අතිරේක පොලී අනුපාතිකය යළි බලාත්මක කරන ලදී. අදාළ අතිරේක පොලී අනුපාතිකය පදනම් අංක 1,000 සිට පදනම් අංක 500 දක්වා අඩු කරන ලදී. භාණ්ඩ නැව්ගත කළ දිනයේ සිට දින 90 ක් හෝ දින 120 ක් (අදාළ වන පරිදි) තුළ අපනයන සඳහා ලබා ගත් ණය නොපියවූ විට දී මෙම අතිරේක පොලී අනුපාතිකය අදාළ වේ. තවද, තේ අපනයන සඳහා ලබාගත් ණය පියවීමේ දී අපනයන සම්බන්ධයෙන් භාණ්ඩ නැව්ගත කළ දින සිට බලපත්‍රලාභී වාණිජ බැංකුවල අභිමතය පරිදි ණය පියවීමේ කාලය දින 180 දක්වා දීර්ඝ කිරීමට ඉඩ ලබා දෙන ලදී. |
| 2015 ජූලි 28 | - | විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කරන ගනුදෙනුවක උපරිම වටිනාකම සහ ගනුදෙනු සඳහා අය කළ හැකි උපරිම ගාස්තු පැනවීම සඳහා පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල උපරිම වටිනාකම සහ ගාස්තු සඳහා වූ 2015 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2015 අගෝස්තු 06 | - | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා සිදු කරන අරමුදල් පැවරීම් සඳහා අය කළ හැකි උපරිම ගාස්තු නියම කිරීම සඳහා ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි ගනුදෙනුවල උපරිම ගාස්තු සඳහා වූ 2015 අංක 02 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2015 අගෝස්තු 07 | - | තත්කාලීන දළ පියවීමේ පද්ධතිය හරහා සිදු කරන අරමුදල් පැවරීම් සඳහා අය කළ හැකි උපරිම ගාස්තු නියම කිරීමට සහ තත්කාලීන දළ පියවීම් පද්ධතියේ මෙහෙයුම්කරු ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව අය කරන මෙහෙයුම් ගාස්තු අඩු කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි ගනුදෙනුවල උපරිම ගාස්තු සඳහා වූ 2015 අංක 03 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 14 | - | මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ප්‍රදානය කරනු ලබන ණය සහ අත්තිකාරම් වෙනුවෙන් 2015 සැප්තැම්බර් 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි, සියයට 70 ක උපරිම වටිනාකම මත ණය අනුපාතයක් පවත්වා ගෙන යන ලෙස බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට විධිවිධානයන් නිකුත් කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 29 | - | සියයට 70 ක උපරිම වටිනාකම මත ණය අනුපාතයක් පවත්වා ගෙන යෑමේ විධිවිධානය බලපැවැත්වෙනුයේ 2015 දෙසැම්බර් 01 දින සිට බව බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට දැනුම් දීම සඳහා විධිවිධානයන් නිකුත් කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 30 | - | මෝටර් වාහන ආනයනය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ ණයවර ලිපි විවෘත කිරීමේ දී 2015 දෙසැම්බර් 01 දක්වා සියයට 100 ක අවම ආන්තික මුදල් තැන්පතුවක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවක් පනවන ලදී. |

2015 නොවැම්බර් 30 - කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හා සම්බන්ධ වීමේ කාලසීමාවන් නියම කිරීම සඳහා ලංකාපේ-කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හා සම්බන්ධ වීමේ නියමිත කාලය පිළිබඳ 2015 අංක 07 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2015 දෙසැම්බර් 02 - ආයතනික යහපාලනය සම්බන්ධයෙන් බැංකු පනත යටතේ නිකුත් කර ඇති විධානයන්හි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා බැංකුවෙහි විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් එහි ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ලෙස සලකන මෙන් බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

**අපේක්ෂිත** - බලපත්‍රලාභී බැංකුවලට අදාළව බාසල් III යටතේ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සහ තෝලන අනුපාතය ක්‍රියාවට නැංවීම

- බැංකුවල සයිබර් ආරක්ෂණය සම්බන්ධ සිදුවීම් ඇතිවන අවස්ථාවන් පිළිබඳව තොරතුරු යොමු කරන මෙන් බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දීම

- බලපත්‍රලාභී බැංකුවල අර්බුදවලට සූදානම් වීම සම්බන්ධයෙන් සැලැස්මක් සම්පාදනය කිරීම

**අනෙකුත් මූල්‍ය ආයතන**

2015 ජුනි 23 - බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වන වාර්ෂික ලියාපදිංචි ගාස්තුව පහත පරිදි ඉහළ නංවන ලදී.

| පූර්ව ලිත් වර්ෂයේ අවසානයට මුළු වත්කම් ප්‍රමාණය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රුපියල්) |
|---|---|
| රුපියල් බිලියන 5 හෝ ඊට අඩු | 1,000,000 |
| රුපියල් බිලියන 5 ට වැඩි සහ රුපියල් බිලියන 10 දක්වා | 1,500,000 |
| රුපියල් බිලියන 10 ට වැඩි සහ රුපියල් බිලියන 20 දක්වා | 2,000,000 |
| රුපියල් බිලියන 20 ට වැඩි | 3,000,000 |

- බලපත්‍රය ලබා ගන්නා වර්ෂය සඳහා ගෙවිය යුතු බලපත්‍ර ගාස්තුව රුපියල් මිලියන 1 සිට රුපියල් මිලියන 2 දක්වා වැඩි කරන ලදී.

**අනෙකුත්**

2015 මාර්තු 26 - හිමිකම්පාන්නන් විසින් ඉදිරිපත් කරන හේතුව තහවුරු කර ගැනීමට යටත්ව හිමිකම් අයදුම් කරන දින සිට දින 60 ක් ඇතුළත සියලුම රක්ෂණ සමාගම් විසින් සිය රක්ෂණ වාරික අදාළ හිමිකම්පාන්නා වෙත පියවීම අවශ්‍ය බව නියෝග කරමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් විධිවිධානයක් නිකුත් කරන ලදී.

2015 මාර්තු 30 - සියලුම රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් 2015 සැප්තැම්බර් 30 දින සිට අවම වශයෙන් රුපියල් මිලියන 1.125 ක ශුද්ධ ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු අතර 2016 සැප්තැම්බර් 30 දින සිට රුපියල් මිලියන 2.5 ක අවම ශුද්ධ ප්‍රාග්ධනයක් පවත්වා ගත යුතු බව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් කොන්දේසියක් වශයෙන් සියලුම රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත නිවේදනය කරන ලදී.

2015 අප්‍රේල් 24 - මූලික මහජන නිකුතුවක් මගින් කොටස් නිකුත් කිරීමේ දී අදාළ වන අර්පණ මිල පදනම් වන කරුණු අනාවරණය කිරීමට නියෝග කරමින් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබූ විධිවිධානයට (SEC/LEG/14/12/41) අනුකූලව කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කිරීමේ නීති සංශෝධනය කරන ලදී.

2015 මැයි 27 - සියලුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන් විසින් සිය සමාගම්වල ලියාපදිංචි වී සිටින රක්ෂණ නියෝජිතයන්ගේ නාමලේඛණයක් (පුද්ගලයන්ගේ හැර) පවත්වා ගෙන යා යුතු බවට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයෙහි අංක 1916/10 දරන නියෝගය නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 2015 මැයි 29 | - | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙන ණය සඳහා අය කරන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 9 සිට සියයට 7 දක්වා ද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙන ප්‍රතිමූල්‍ය පහසුකම් සඳහා වන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 4 සිට සියයට 3 දක්වා ද අඩු කරන ලදී. |
| 2015 ජූනි 10 | - | කොළඹ කොටස් වෙළඳපොළ විසින් 2015 ජූනි 17 දින සිට බලපැවැත්වෙන පරිදි ස්වයංක්‍රීය ගනුදෙනු පද්ධතිය හරහා ගනුදෙනු වන සුරැකුම්පත්වල (ණය සුරැකුම්පත් හැර) "සමාප්ති මිල" (closing price) ගණනය කිරීමේ ක්‍රමවේදය සංශෝධනය කරන ලදී. |
| 2015 ජූලි 01 | - | රන් භාණ්ඩ උකස් ණය සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන කාල සීමාව 2015 ජූලි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා තවත් මාස හයකින් දීර්ඝ කරන ලදී. |
| 2015 ජූලි 06 | - | ගුදම් ලදුපත් ඇප ලෙස තබා ගනිමින් සුළු පරිමාණ ගොවීන්හට කෙටිකාලීන ණය ලබා ගැනීමට හැකි වන පරිදි නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2015 ජූලි 10 | - | ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සමාගම් ලියාපදිංචි වීමට හෝ ලියාපදිංචිය අලුත් කිරීමට අදාළ අයදුම්පත් ගාස්තු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අංක SEC/Stamp duty/2015/03 දරන චක්‍රලේඛයට අනුකූලව සංශෝධනය කරන ලදී. |
| 2015 අගෝස්තු 07 | - | රජය විසින් හඳුන්වා දෙනු ලැබූ "තේ කර්මාන්ත ශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය" ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2015 සැප්තැම්බර් 03 | - | ණය ලාභීන්ගෙන් අය කර ගන්නා වාර්ෂික පොලී අනුපාතිකය සියයට 6 ක ස්ථාවර අගයක පවත්වා ගැනීම සහ රජය මගින් සහභාගීත්ව මූල්‍ය ආයතනයට ලබා දෙන සියයට 2 ක වාර්ෂික පොලී සහනාධාරය වසර දෙකක් සඳහා පමණක් ලබා දීම සහ ඉන් පසු මුළු පොලී ප්‍රමාණයම ණය හිමියන්ගෙන් අය කර ගැනීම යන කරුණු ඇතුළත් කිරීම සඳහා තේ කර්මාන්ත ශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 09 | - | ශ්‍රී ලංකාවේ වෙසෙන කිසිදු පුද්ගලයෙකුට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී නොමැති රක්ෂණ සමාගමක් සමග ඍජුව හෝ වක්‍රාකාරව රක්ෂණ ව්‍යාපාරවල (නැවත රක්ෂණය කිරීමේ ව්‍යාපාර හැර) නිරත විය නොහැකි බව දන්වමින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් එතෙර සෞඛ්‍ය රක්ෂණය සඳහා වන චක්‍රලේඛ අංක 36 නිකුත් කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 12 | - | තේ කර්මාන්තශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතිකය ගනුදෙනුකරු හා සහභාගීත්ව මූල්‍ය ආයතනය අතර පවත්නා සම්බන්ධතාවය මත තීරණය කිරීම සඳහා සහභාගීත්ව මූල්‍ය ආයතනවලට අවසර ලබා දීමට අදාළව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2015 ඔක්තෝබර් 21 | - | රක්ෂණ නියෝජිතයින් විසින් දිගුකාලීන සහ සාමාන්‍ය යන රක්ෂණයන් දෙකටම රක්ෂණ ව්‍යාපාර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් දැඩි අනුකූලතාවයන්ට යටත්ව අවසර ලබා දෙන ලදී. |
| 2015 නොවැම්බර් 02 | - | තේ කර්මාන්තශාලා සඳහා වන කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කර ඇති ණය සඳහා පාවෙන පොලී අනුපාතිකයක් යොදා ගැනීමට සහභාගීත්ව මූල්‍ය ආයතන සඳහා අවසර ලබා දුන් අතර එය ශ්‍රී ලංකා රජය විසින් ප්‍රදානය කරන සියයට 2 ක පොලී සහනාධාරය ද ඇතුළත්ව බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය සහ තවත් සියයට 1.5 ක් නොඉක්මවිය යුතුය. පොලී සහනාධාරය සපයනු ලබන්නේ වසර 2 ක් සඳහා පමණක් වන අතර ඉන්පසු මුළු පොලී ප්‍රමාණයම ණය ප්‍රතිලාභියාගෙන් ලබා ගත යුතුය. |
| 2015 නොවැම්බර් 09 | - | දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - අදියර II සහ දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල - අදියර II යටතේ සහභාගීත්ව මූල්‍ය ආයතන මගින් ණය මුදල් ලබා දීමේ දී අය කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය සියයට 12 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී. |

| | | |
|---|---|---|
| 2015 දෙසැම්බර් 15 | - | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් පහත සඳහන් කරුණු ඇතුළත් වන පරිදි සංශෝධනය කරන ලදී.<br>- ව්‍යාපෘති අගැයීම් වාර්තා අවශ්‍යතාව සඳහා සලකා බලනු ලබන ණය මුදල් සීමාව රුපියල් 500,000 සිට රුපියල් මිලියනයක් දක්වා ඉහළ දැමීම<br>- ණය යෝජනා ක්‍රමය යටතේ බහු වාර්ෂික බෝග සඳහා ලබා ගන්නා ණය මුදලට අදාළ සහන කාලය ව්‍යාපෘතියේ ස්වභාවය අනුව උපරිමය මාස 12 ක් දක්වා ඉහළ දැමීම<br>- ණය යෝජනා ක්‍රමය යටතේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයක් ලෙස සුදුසුකම් ලැබීමට පවතින, පුද්ගලයන් පහක අවම සේවක සංඛ්‍යාවේ අවශ්‍යතාව ඉවත් කරන ලදී. ඒ අනුව, යම් ව්‍යාපාරයක සේවක සංඛ්‍යාව සියයට අඩු නම් සහ එහි භූමිය හා ගොඩනැගිලි හැර ඉතිරි වත්කම්වල වටිනාකම රුපියල් මිලියන 40 ට අඩු නම් එම ව්‍යාපාරය ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට සුදුසුකම් ලබයි. |
| 2015 දෙසැම්බර් 31 | - | රන් භාණ්ඩ උකස් ණය අත්තිකාරම් සඳහා වූ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් කටයුතු අවසන් කරන ලදී. |
| 2016 ජනවාරි 01 | - | කොටස් හුවමාරු බද්ද ඉවත් කරන ලදී. |
| | - | ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නුබුන්වත් ආන්තික නීති (අවදානම මත පදනම් වූ ප්‍රාග්ධනය) නිකුත් කරන ලදී. |
| | - | පාසල් යන ළමුන් සඳහා ළමයෙකුට අවම වශයෙන් රුපියල් 250 ක් තැන්පත් කරමින් ළමා ඉතුරුම් ගිණුම් ආරම්භ කිරීම සඳහා විධිවිධාන නිකුත් කරන ලදී. |
| 2016 ජනවාරි 04 | - | කොටස් හිමිකාරිත්වයෙහි සියයට 50 කට වඩා වැඩි හිමිකම සහ අධිකාරිත්වය සම්බන්ධ වෙනසක දී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට නියෝග කරමින් රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි 96A වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සියලුම රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් වෙත විධිවිධානයක් නිකුත් කරන ලදී. |
| 2016 ජනවාරි 27 | - | 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති නිකුත් කරන ලදී. |